**පල්ලේපොල ප්‍රාදේශීය සභාව**
**මාතලේ දිස්ත්‍රික්කය**
**-------------------------------**

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 27 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2014 නොවැම්බර් 27 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදි.

1.2 මතය
-------

මෙම වාර්තාවේ 1.3.3, 1.3.4, 1.3.6 යන ඡේද වල දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතු කොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම
-----------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති
--------------------------

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම් ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කර නොතිබුණි.

1.3.3 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ). ගොඩනැගිලි සංවර්ධනය සඳහා වැයකර තිබූණු රු.3,646,467ක් හා රු.46,116 ක් වූ කාර්යාල උපකරණවල වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබූ අතර, හපුගස්යායලන්ද වත්ත ඉඩමේ පර්චස් 27.9ක බිම් කොටසේ වටිනාකම තක්සේරු කොට ගිණුම්ගත කර නොතිබුණි.

(ආ). සභාව සතු කැබ්රථයක් අළුත්වැඩියා කිරීම සඳහා දරා තිබුණු රු.1,440,000ක ප්‍රාග්ධන වියදම මෝටර් රථ හා කරත්ත ගිණුමට ගැලපුම් කර නොතිබුණි.

(ඇ). ඉදිරි වර්ෂය වෙනුවෙන් ලැබී තිබුණු රු.45,636ක් වූ ආදායම්, කලින් ලැබූ ආදායම් යටතේ ගිණුම්ගත කර නොතිබුණු අතර, රු.1,882,394ක් වූ ජල ගාස්තු ඇස්තමේන්තු ආදායමද පොදු තැන්පත් ගිණුමේ දක්වා තිබුණි.

(ඇ). දේපළ, පිරියත හා උපකරණ ගිණුමේ ශේෂය සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුමේ ශේෂය අතර රු.38,032ක වෙනසක් දක්නට ලැබුණි.

(ඉ). සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් සහ ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි.

1.3.4 නොසැසඳූ පාලන ගිණුම්
-----------------------------
එකතුව රු.29,983,481 ක්වූ ගිණුම් විෂයයන් 06 ට අදාළ ශේෂයන් සහ ඒවාට අදාල උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර රු.18,073,820ක අසමානතා නිරීක්ෂණය විය.

1.3.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
-------------------------------------
පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ). ලැබිය යුතු ගිණුම්
---------------------
සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 06ක එකතුව රු.379,404ක් වූ අතර, වර්ෂ 05 කට වැඩි කාලයක් ඉක්මවූ රු.103,505ක ශේෂයක් ද ඊට ඇතුළත් වී තිබුණි.

(ආ). ගෙවිය යුතු ගිණුම්
----------------------
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණයහිමි ශේෂවල එකතුව රු.23,269,674ක් වූ අතර, වර්ෂ 02ත් වර්ෂ 05ත් අතර කාලයට අයත් රු.1,275,753ක ශේෂ හා වර්ෂ 05ක කාලයක් ඉක්මවූ රු.38,150ක ශේෂ ඊට ඇතුළත්ව තිබුණි.

1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම
------------------------------------
අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.29,659,974ක්වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.7 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම
--------------------------------------------------
පහත දැක්වෙන නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ). <u>1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත</u> | |
| (i). 126 (ඌ) වගන්තිය | අතුරු ව්‍යවස්ථා සම්පාදනය නොකර වාහන නැවතුම්පලවලින් රු.46,500ක ආදායම් උපයා තිබුණි. |

| | |
|---|---|
| (ii). 126(vii) (ඊ) 126(xxx) වගන්ති හා පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශ ලේකම්ගේ අංක සීඑල්/10සී/01/11 දරන 2011 ජූනි 13 දරන ලිපිය | බල ප්‍රදේශයේ ප්‍රදර්ශනය කර ඇති විශාල දැන්වීම් පුවරු වෙනුවෙන් ගාස්තු අය කර නොතිබුණි. |
| (iii) 132(ඒ)සහ (ඕ) වගන්ති | අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා නොගෙන රු.55,000 ක වියදම්දරා තිබුණු අතර, සභාපතිවරයාගේ පෞද්ගලික මෝටර් රථය භාවිතා කිරිම වෙනුවෙන් සභා අරමුදලින් රු. 33,131 ක ඉන්ධන ලීටර් 205 ක් ලබා දී තිබුණි. |
| (ආ). <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය</u> | |
| (i). මුදල් රෙගුලාසි 104(i) | ගින්නකට ලක්වූ සභාවට අයත් කැබ්රථය පිළිබඳව යොමුගත රෙගුලාසිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |
| (ii). මුදල් රෙගුලාසි 571 හා 572 | වසර 02 ක කාලයක් ඉක්ම වූ රු. 447,575 ක තැන්පත් ශේෂ 12ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,981,960ක්වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,542,074ක් විය.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ අවසානයට සමුච්චිත අරමුදලේ රු.1,510,329 ක ශේෂය සහ රු.1,548,361 ක් වූ කාරක ප්‍රාග්ධන ශේෂය ඍණ අගයක් ගෙන තිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 බදු කුලී සහ ජල ගාස්තු

සමාලෝචිත වර්ෂය අවසානයට රු.59,570 ක බදුකුලී ශේෂයන් සහ රු.1,321,232 ක් වූ ජල ගාස්තු ආදායම් අයවිය යුතුව තිබුණි.

2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------------

පළාත් සභා ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.198,854 ක මුදලක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු. 4,259,267 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ). වටිනාකම රු.79,501ක් වූ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ අයිතම 15ක ඌනතාවයක් පැවතියද, ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ). සභාවට අයත් කැබ් රථයේ දෛනික ධාවන සටහන්පත්වල වාහනය භාවිතා කළ නිලධාරියා විසින් ධාවනය කළ දුර ප්‍රමාණය තම අත්සන තබා තහවුරු කර නොතිබුණි.

(ඇ). සභාව සතු ගොඩනැගිල්ලක් කිසිදු ගාස්තුවක් අය කිරිමකින් තොරව පෙර පාසලක් පවත්වාගෙන යාමට ඉඩකඩ ලබා දී තිබූ අතර සභාව සතු වෙනත් භූමියක ගොඩනැගිල්ලක් ඉදිකිරීමටද මහ සභාවේ අනුමැතිය ලබා නොගෙන බාහිර පාර්ශවයන් දෙකකට ඉඩකඩ ලබාදී තිබුණි.

3.2 නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

----------------------------------------

වටිනාකම රු.957,400ක්වූ වත්කම් ඒකක 04ක් සහ වටිනාකම ගණනය කර නොමැති වත්කම් ඒකකයක් නිශ්ක්‍රීයව පැවතුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය

---------------------------

1988 (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 5(7) රීතිය ප්‍රකාරව අභ්‍යන්තර විගණන ක්‍රමයක් පවත්වා ගෙන ගොස් නොතිබුණු අතර, විගණන හා කළමනාකරණ කමිටුද පිහිටුවා නොතිබුණි.

4.2 අයවැය පාලනය

--------------------

විධිමත් අනුමැතියක් ලබා ගැනීමකින් තොරව වැය විෂයයන් දෙකක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා පිළිවෙලින් සියයට 142ක හා සියයට 768ක වියදම් දරා තිබුණු අතර වැය විෂයයන් 10ක ඇස්තමේන්තු කර තිබුණු රු.682,750ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි. වැය විෂයයන් 15ක ප්‍රතිපාදන ඉතිරිවීම් සියයට 12 සිට සියයට 99 දක්වා වූ පරාසයක පැවතුණු අතර ආදායම් විෂයයන් 07ක් යටතේ ඇස්තමේන්තු කර තිබුණු ආදායම් රැස් කිරීමේ ප්‍රගතිය සියයට 23.5ක් තරම් පහළ මට්ටමක පැවතුණි. ඒ අනුව ආදායම් හා වියදම් පාලනයේදි අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

4.3 නොවිසඳී ඇති හා පිළිතුරු නොලත් විගණන විමසුම්
---

සභාව වෙත ඉදිරිපත් කරන ලද විගණන විමසුම් වලින් 02 කට පිළිතුරු සපයා නොතිබුණු අතර, එකී විමසුම් වලට භාජනය වූ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.207,280ක් විය.

5. පද්ධති හා පාලන
---

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ). හිඟ ආදායම් අයකර ගැනීම.
(ආ). අයවැය පාලනය.
(ඇ). වත්කම් කළමනාකරණය.
(ඈ). ණයගැති හා ණයහිමි පාලනය.
(ඉ). අභ්‍යන්තර පාලනය.
(ඊ). මූල්‍ය පාලනය.